# යළි පදිංචි කිරීම් අවසන්
## ඒත් ඇත්ත බලන්න පුදුකුඩිඉරුප්පු වලටම ඇවිත් යන්න

රුකී ප්‍රනාන්දු

**රට වටින්ම සිංහල සංචාරකයන් මෙම ප්‍රදේශ නැරඹීමට පැමිණෙනවා. ඔවුන් යුධ ස්මාරක නැරඹීමට ගියත් අඩුතරමින් නැවැතී අප සමග වචනයක් හෝ කතා කිරීමටවත් උත්සාහ කරන්නේ නැහැ. අප ජීවත් වන්නේ කෙසේද යන්න දැන ගැනීමටවත් ඔවුන්ට වුවමනාවක් නැහැ.**

පසු ගිය සැප්තැම්බර් 14 වන සිකුරාදා මුලතිව් දිස්ත්‍රික්කයේ මන්තුවිල් හා පුදුකුඩිඉරුප්පු යන ප්‍රදේශවල නැවත පදිංචිවීමට උත්සාහ කරන මගේ මිතුරන් හමුවීමට මා එහි ගියෙමි.

මාගේ එක් මිතුරකු සතුව මන්තුවිල් ප්‍රදේශයේ අක්කර 4ක් පුරාවට ඇති භූමියක අලංකාර නිවසක් තිබේ. එමෙන්ම අප දෙදෙනාම අසා ඇති පරිදි මෙම ප්‍රදේශය බොහෝ කලකට පෙර බිම් බෝම්බ ඉවත් කිරීමකට ලක් කර ඇත. ඇත්ත වශයෙන්ම උතුරේ බොහෝ ප්‍රදේශ වල දී මා දැක ඇත්තාක් මෙන් මෙහිද කිසිදු අනතුරු දැන්වීම් පුවරුවක් සවි කර නැත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා යුධ හමුදාව තවමත් මගේ මිතුරාට හෝ ඔහුගේ පවුලේ අයට එම නිවසට ඇතුලුවීමට ඉඩ දී නැත. තම නිවසින් පලවා හරිනු ලදුව වසර ගණනාවකට පසුව හෝ නැවත එහි යාමට ඔහු බලවත් ආශාවකින් පසු වේ. නමුත් ඔහු පවසන්නේ ආරක්ෂක අංශ දිගින් දිගටම ඔවුන්ට එහි පදිංචියට යාමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන බවයි. පුදුමයට කාරණය වනුයේ ඔවුන් ඒ සඳහා කිසිදු සාධාරණ හේතුවක්ද ඉදිරිපත් නොකිරීමයි.

පසුගිය අගෝස්තු මාසයේදී ප්‍රදේශයේ බොහෝ දෙනා නැවත පදිංචි වීම සඳහා පුදුකුඩිඉරුප්පු ප්‍රදේශයට පැමිණීමත් සමග ඔහුද පුදුකුඩිඉරුප්පු, මුලතිව් මාර්ගයේ ඔහුගේ නිවසට ආසන්නයෙන් තාවකාලික මඩුවක් එම ඉඩමේ හිමිකරුගේ අවසරය ඇතිව ඉදිකර තිබේ. ඒ ඔහුගේ නිවසේ ඉතිරි වී ඇති කොටස හෝ ආරක්ෂා කර ගැනීමටයි. ඔහු පවසන්නේ යුද්ධය අවසන් වීමෙන් පසුව තම නිවසේ දොර ජනේල, සිවිලිම් තහඩු, උළු කැට මෙන්ම වැසිකිළි පෝච්චියද සොරා ගෙන ගොස් ඇති බවයි. ඔහුට තවමත් මෙම සොරකම් යුධ ගැටුම් පවතින කාලයේදී සිදුවූවා ද යන්න පිළිබඳ ස්ථිර විශ්වාසයක් නැත. ඔහු පවසන්නේ සොරකම් කරගෙන ගොස් ඇති බොහෝ දේ මීට මසකට පමණ පෙරද එහි තිබූ ඒවා බවයි.

මගේ මිතුරා සතුව එම ඉඩමේ පොල් ගස් 300ක් පමණ තිබිණි. නමුත් ෂෙල් ප්‍රහාර හේතුවෙන් සමහර පොල් ගස් වලට හානි සිදුවී තිබේ. කෙසේ වෙතත් ඔහු සඳහන් කරන්නේ ඉතිරි වී ඇති පොල් ගස් වල ඵලදාව පසුගිය වසර කිහිපය පුරාවටම සොරකම් කරගෙන ඇති බවයි. ඔහු සැක කරන්නේ ආරක්ෂක අංශ විසින් මෙලෙස සොරුන්ට අනවසරයෙන් ඉඩමට ඇතුලුවීමට ඉඩ දී ඇති බවයි. තවමත් ප්‍රදේශයේ සම්පූර්ණ පාලනය තමන් සතුකරගෙන සිටින යුධ හමුදාව මගේ මිතුරා තම ඉඩමට යන සෑම අවස්ථාවකම ඉක්මනින්ම ඔහු පළවා හැරීමට සමත් වුවත් සොරුන්ට එවැනි තර්ජනයක් තිබී ඇති බවක් පෙනෙන්නට නැත. යුධ හමුදාව මගේ මිතුරා තම දේපළ වලට පැමිණීම වැළැක්වීමට හේතුව ඇත්ත වශයෙන්ම බිම් බෝම්බ හා පුපුරණ ද්‍රව්‍ය නම් සොරුන්ට විශේෂ විනිර්මුක්තියක් ලැබී ඇති බවක් පෙනේ.

එක් අතකින් මගේ මිතුරා වාසනාවන්තය. ඒ කිලිනොච්චියේ සිටින ඔහුගේ ඥාතියකු නැවත පදිංචියට යන තුරු ඔහුට හා ඔහුගේ පවුලේ අයට නැවතී සිටීම සඳහා තම නිවසේ ඉඩදීම නිසාය. කෙසේවෙතත් මාන්තුවිල්හි බොහෝ දෙනා එතරම් වාසනාවන්ත නැත. එබවින් ඔවුන්ට තම නිවාස වලට පැමිණීමට පෙර මැණික් ෆාම් සරණාගත කඳවුරේ වසර 3 කට වඩා වැඩි කාලයක් රැඳී සිටීමට සිදුවීම හැර වෙනත් විකල්පයක් නොවීය. මගේ මිතුරා මෙන්ම ඔවුන්ද සිය ගම් බිම් කරා නැවත යාමට දැඩි ආශාවකින් පසුවෙති. කෙසේ වෙතත් ආරක්ෂක අංශ පසුගිය සතියේ ඔවුන්ට දන්වා තිබුණේ ඔවුන්ට නැවත තම ගම් බිම් කරා යාමට හැකි වන්නේ එළඹෙන දෙසැම්බර් මාසයේදී බවයි. මින් පෙර ඔවුන් අත්දුටු බලාපොරොත්තු කඩවීම් හා ප්‍රමාද කිරීම් නිසා තවදුරටත් ආරක්ෂක අංශ, දේශපාලනඥයින් හෝ රජයේ නිලධාරීන්ගේ පොරොන්දු පිළිබඳ එම ජනතාවට කිසිදු විස්වාසයක් නැත.

අප මගේ මිතුරාගේ නිවස ඉදිරිපිට කතාබහ කරමින් සිටින විට පුදුකුඩිඉරුප්පු - මුලතිව් මාර්ගයේ බස් රථයක් ගමන් කළේ ය. එම බස් රථයෙන් නැගුනු බයිලා සංගීත නාදය අපටද ඇසිනි. පහැදිලිවම එහි ගමන් ගත්තෝ ඉතා ප්‍රීතියෙන් සිටියහ. නමුත් පසැදිලිවම මගේ මිතුරා තුළ එවැනි ප්‍රීතියක් නොවීය. ඔහු පැවසුවේ සිය ගණන් බස් රථ දිනපතා මෙහි පැමිණෙනවා. රට වටින්ම සිංහල සංචාරකයන් මෙම ප්‍රදේශ නැරඹීමට පැමිණෙනවා. ඔවුන් යුධ ස්මාරක නැරඹීමට ගියත් අඩුතරමින් නැවැතී අප සමග වචනයක් හෝ කතා කිරීමටවත් උත්සාහ කරන්නේ නැහැ. අප ජීවත් වන්නේ කෙසේද යන්න දැන ගැනීමටවත් ඔවුන්ට වුවමනාවක් නැහැ. ඔවුන් අපට වඩා හාත්පසින්ම වෙනස් බව හා අපේ දුක් වේදනා හා අපට සිදුවූ අසාධාරණකම් පිළිබඳව අල්පයක් හෝ ඔවුන් නොතකන බවයි මා සිතන්නේ කියා ය.

පසුගිය මාසයක පමණ කාලයක තුළ මුල්ලෙවයික්කාල්, වලයිනගර්මඩම්, ආනන්දපුරම් වැනි ගම්මාන අවට වාසය කල සමහර පිරිස් වලට අවසානයේදී නැවත පදිංචි වීම සඳහා වසර 3 කට පමණ පසුව ඉඩ ලැබී තිබිණි. අපට එහිදී හමුවූ සියලු දෙනාම අප හා ප්‍රකාශ කළේ රජයෙන් ඔවුන්ට ලැබෙන සහය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවයි. කෙසේ වෙතත් බිම් බෝම්බ, අඩු සැලකිලි, අවම පහසුකම් හා බිහිසුණු මතක අතරේ පවා තම ගම් බිම් කරා නැවත පැමිණීමට හැකි වීම පිළිබඳව ඔවුහු සතුටු වෙති. එහිදී මා දුටු විශේෂත්වයක් නම් බොහෝ දෙනා ආනන්දපුරම්හි ඇති බලකොටු පිළිබඳව කතා කිරීමයි. එය 2009 වසරේදී යුද්ධයේ අවසන් අදියරේදී කොටි නායකයන් ඇතුළු ත්‍රස්තවාදීන් බොහෝ දෙනෙකු ආරක්ෂක හමුදා වලට කොටු වූ ස්ථානයයි.

කිහිප තැනකදීම එහි සිටි අය මට බෝම්බ හා නිෂ්ක්‍රිය නොකළ පුපුරණ ද්‍රව්‍ය මට ගෙනවිත් පෙන්වූහ. කැලෑ එළි කිරීම සඳහා රජයෙන් කිසිදු සහායක් නොලැබෙන නිසා බියෙන් වුවත් ගම්වාසීන් සිදු කරනේ කැලෑවලට ගිනි තැබීමයි. නැවත පදිංචියට ආ බොහෝ දෙනෙකුගේ පැමිණිල්ල වනුයේ තම නිවාස වල දොර ජනේල හා සෙවිලි තහඩු සොරකම් කරගෙන ගොස් ඇති බවයි. පුඩුකුඩිඉරුප්පු ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ කන්‍යා සොහොයුරියන් හානියට පත් කන්‍යා අසළ තාවකාලික නිවහනක් සාදාගැනීමට පැමිණ තිබෙන අතර ඔවුන් පවසන්නේ සති කිහිපයකට පෙර එහි තිබූ සියලු දොර ජනේල ඔවුන් පැමිණෙන විට ගලවා ගෙන ගොස් ඇති බවයි.

එම සන්ධ්‍යාවේදීම මා වේලකන්නි දේවස්ථානය වෙතද ගියෙමි. එය පිහිටා ඇත්තේ පුදුකුඩිඉරුප්පු * මුලතිව් මාර්ගයේ මන්තුවිල්හි ඉදිකර ඇති අලංකාර යුධ ස්මාරකය හා කෞතුකාගාරයට මීටර් කිහිපයක් මුලතිව් දෙසට වන්නටයි. පසුගිය සැප්තැම්බර් 8 වනදා සිට මෙම කුඩා දේවස්ථානය පුද්ගලයින් 24 දෙනකුගෙන් සමන්විත පවුල් 6 කට රැකවරණය සලසා ඇත. ඉන් 14 දෙනකු කුඩා ළමුන් වෙති. ඔවුහු හින්දු භක්තිකයන් වුවත් දේවස්ථානය කෙරෙහි ඉතා ගරු සරු ඇතිව සිටීමට ඔවුන් කටයුතු කර ඇති බව දැකීම සතුටට කරුණක් වන අතර ඔවුහු ක්‍රිස්තු භක්තිකයන් මෙන් දේවස්ථානය තුළ ඉටි පහන් ද දල්වා තිබීම අගනේ ය.

මෙම පිරිස සාමූහිකව අයත් කරගෙන සිටි අක්කර 10ක් පමණ වන බිම් කොටස මේ වන් විට ආරක්ෂක හමුදා විසින් බලයෙන් අත්පත් කරගෙන තිබීම කණගාටුවට කරුණකි. වසර 3 කට වඩා වැඩි කාලයක් තම ගම් බිම් කරා යාමට දැඩි ආශාවකින් පසු වූ මොවුන්ට නැවත පැමිණීමෙන් පසුව දැකගන්නට ලැබුණේ තම ඉඩමේ විශාල යුධ ස්මාරකයක් ඉදි කර ඇති බවයි. මෙම පවුල් සතුව තම අයිතිය ප්‍රකාශ කළ හැකි ඔප්පු හා අනෙකුත් ලියවිලි ඇතත් ආරක්ෂක අංශ විසින් මාන්තුවිල් හි මෙම ඉඩම අත්පත් කර ගැනීමේදී පිළිගත හැකි නීතිමය ක්‍රියාමාර්ගයක් අනුගමනය කර ඇති බවට සාක්ෂි නොමැත. මෙම පවුල් වලට අනුව හමුදා ප්‍රධානීන් විසින් මොවුන්ට පවසා ඇත්තේ මාස 40 කට වඩා අධික කාලයක් කිසිදු කුලී මුදලක් ගෙවීමකින් තොරව එහි රැඳී සිටි හමුදා භට පිරිස් ඉවත් කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය බැවින් එ■ක් විකල්ප ස්ථානයකට යන ලෙසයි. කෙසේ වෙතත් ඉඩමේ අයිතිකරුවන් විසින් ප්‍රකාශ කරන පරිදි වසර ගණනාවක් තිස්සේ රාජ්‍ය නොවන සංවිධාන වල ආධාර මත යැපීමෙන් අනතුරුව තමන් විසින්ම ආදායමක් ලබාගනු පිණිස ඉඩමේ තිබූ විශාල පොල් ගස් ප්‍රමාණයේ ඵලදාව ලබාගැනීමට ඔවුන් අදහස් කර තිබී ඇත. ඔවුන් බල කර ඉල්ලා සිටින්නේ ඔවුන්ට යා හැකි වෙනත් තැනක් නොමැති නිසා ඔවුන්ට අයත් භූමිය නැවත ඔවුන්ට ලබා දෙන ලෙසයි. අවසානයේ දින 2ක් තුළ ඉඩමින් ඉවත්වන බව ඔවුන්ට හමුදා විසින්



16 වන පිටට